# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2276/54 – 2022 අප්‍රේල් මස 22 වැනි සිකුරාදා – 2022.04.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

(2 වන අධිකාරය වූ) අර්ථ නිරූපණ ආඥාපනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තිය අනුව නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යවරයා විසින් අංක 2017/51 සහ 2017.05.05 දිනැති *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘති අදියර II යටතේ කෙසෙල්වත්ත භූගත ජලාශය ඉදිකිරීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන නිශ්චල දේපළ අත්කර ගැනීමට අදාළ නියමය 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය වාසුදේව නානායක්කාර වන මා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය: DVP/02/02/KT/189.
2022 මාර්තු මස 28 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
අංක 35, ''ලක්දිය මැදුර'',
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 670, හොරේතුඩුව ග්‍රාම නිලධාරි වසමේ හොරේතුඩුව ගමේ පිහිටි පොකුණවත්ත *නොහොත්* ගංගාරාම විහාරස්ථාන වත්ත නමැති ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 20ක් පමණ වන බලයලත් මිනින්දෝරු ජී. අබේගුණවර්ධන මිය විසින් 2016.06.22 දින සකස් කර ඇති අංක 2016/W/08 පිඹුරේ කැබලි අංක 01 ලෙස දැක්වෙන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස:

01. **කැබලි අංක 1 - ඉඩමේ නම: පොකුණවත්ත *නොහොත්* තෙල්දෙනවත්ත *නොහොත්* ගංගාරාම විහාරස්ථාන වත්ත - ප්‍රමාණය: පර්චස් 20ක් පමණ**

*උතුරට* : වරි. අංක 18 දරන මාදන්ගහවත්ත ඉඩම සහ චන්ද්‍රසේකර පටුමග;

*නැගෙනහිරට* : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල ඉඩම;

*දකුණට* : ගංගාරාම විහාරස්ථානයේ සිට ගාලු පාර දක්වා වූ මාර්ගය;

*බටහිරට* : වරි. අංක 620 දරන පොකුණවත්ත *නොහොත්* තෙල්දෙනවත්ත *නොහොත්* ගංගාරාම විහාරස්ථාන වත්ත.

*ඉඩමට හිමිකම් කියන අයගේ නම් සහ ලිපිනයන්* :

01. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්,
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

02. ගරු විහාරාධිපති,
ගංගාරාම විහාරස්ථානය,
හොරේතුඩුව,
මොරටුව.

EOG 04 – 0122

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.